

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා

# මහාචාර්ය කුලතිලක කුමාරසිංහ

මහාචාර්ය හර්සන් ඩයස්

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ වර්තමාන පීඨාධිපති සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා ලලිත කලා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන වශයෙන් ද කටයුතු කරන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා සිංහල හා ජපන් භාෂා පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලද විද්වතෙකි. එතුමන් මෑත භාගයේ සාහිත්‍ය විචාරකයකු වශයෙන් ද මහත් කීර්තියක් අත්පත් කරගෙන සිටී. නූතන සිංහල කෙටිකතාව විෂයෙහි විශේෂ අවධානයකින් කටයුතු කරන එතුමා විවිධ ශාස්ත්‍රීය පර්යේෂණයන්හි නිරත විද්වතෙකි.

මාතර දියගහ මටහිර මහා විද්‍යාලයෙන් හා ගාල්ලේ මහින්ද මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලත් එතුමා පාසැල් වියෙහි දී විශේෂ කුසලතා පළ කරමින් 1969 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට ප්‍රවේශ ලද්දේය. එහි ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් උසස් ලෙස සමත් වූ එතුමා ප්‍රධාන විෂය වශයෙන් සිංහලත් අනුවිෂය වශයෙන් ලංකා ඉතිහාසයත් හදාරා 1973 වර්ෂයේ දී ප්‍රථම පන්තියෙන් සාමර්ථ්‍යය ලද්දේය. එසේ ම එකී වර්ෂයෙහි සිංහල විෂයයෙන් ඉහළම ලකුණු ලද සිසුවාට හිමිවන රෝලන්ඩ් රත් පදක්කම දිනා ගැනීමට ද එතුමන් සමත් විය. මෙම වර්ෂයෙහි දී ම සිංහල අධ්‍යයන අංශයේ තාවකාලික සහකාර කථිකාචාර්ය ධුරයට බඳවා ගනු ලැබූ එතුමා පුරා වසර හතරක් සේවයෙහි නිරත වෙමින් සිට 1978 වර්ෂයේ දී ස්ථිර කථිකාචාර්යවරයකු වශයෙන් පත්වීම ලද්දේය. එතැන් පටන් සිංහල කෙටිකතා කලාවේ ආරම්භය හා කලාත්මක විකාශනය පිළිබඳ දීර්ඝ පර්යේෂණයක නියැලුණු එතුමන් එහි ප්‍රතිඵල විසින් 1984 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් දර්ශන විශාරද උපාධිය දිනා ගනු ලැබීය.

අනතුරු ව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට පත් එතුමන් ජපන් භාෂාව විශේෂයෙන් හදාරා ජපන් රජයේ ශිෂ්‍යත්වයක් ලැබ 1985 දී ඔසාකා විදේශ භාෂා විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වී තවදුරටත් පර්යේෂණ